# ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින
# සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා
# රැකියා විරහිත උපාධිධාරීන් බඳවා ගැනීම - 2015

ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ඌව පළාතේ ස්ථිර පදිංචි රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2015.03.03 දින වේ.

**01. බඳවා ගන්නා ශ්‍රේණිය :**

ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණිය

**02. වැටුප් ක්‍රමය :**

රා.ප.ච. 6/2006(XII) හි GE-1-2006 අනුව **රු. 13,410/- 6x145 - 7x180 - 2x215 - 15,970/-** වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන 15,540/- ක මාසික වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

**03. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :**

(අ) අයදුම්කරු / අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඇ) 2015.03.05 දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඌව පළාත තුළ තිබිය යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරනු ලබන පදිංචිය පිළිබඳ ග්‍රාම සේවා සහතිකයක් මගින් (ඩී.එස්. 04 ආකෘතිය) සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය. මෙම සහතිකයෙහි අංක 2 (ඊ) II යටතේ 2012, 2013 සහ 2014 වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයන්හි ඔබගේ නම ලියාපදිංචි කර ඇති බව සහ ඒ ඒ වර්ෂයන් සඳහා ඔබගේ ගෘහමූලික අංකය / ලියාපදිංචි අංකය ඇතුළත් කර ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරීවරයා විසින් සහතික කර අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය.

(ඈ) 2015.03.05 වන දිනට වයස අවුරුදු 18-35 ත් අතර විය යුතුය.

**04. අධ්‍යාපන සුදුසුකම් :**

(අ) විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව භාෂාව / සාහිත්‍ය හා අංක ගණිතය / ගණිතය විෂයන්ද ඇතුළුව, විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම.

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම විෂයයන් තුනකින් එකවර සමත් වීම.

(ඇ) ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් ප්‍රවේශී කරන ලද විෂය ක්ෂේත්‍රවලට අයත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් 2014.12.31 වන දිනට හෝ ඊට පෙර වලංගු වන පරිදි උපාධියක් ලබා තිබීම.

★ සම්මුඛ පරීක්ෂණයේදී වලංගු උපාධි සහතිකය හෝ අදාළ විශ්වවිද්‍යාලයේ සභාපති සභාව මගින් සහතික කරන ලද උපාධි ප්‍රතිඵල සහතිකය ඉදිරිපත් කළ යුතුය.

★ ඉගැන්වීමේ භාෂා මාධ්‍යය : සිංහල මාධ්‍ය

**05. පත්වීම් සම්බන්ධ කොන්දේසි :**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) මුලින් පත් කරන පාසලේ වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

(ඇ) කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ඈ) වසර 05 ක සේවා කාලයකට පසු ඌව පළාතේ වෙනත් පාසලකට සේවා අවශ්‍යතාවය මත ඌව පළාතේ ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව ස්ථාන මාරුවීම් ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදීමට සලකා බලනු ඇත.

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව පාසල් පාදක ක්‍රමය යටතේ බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

තරග විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ විෂය නිර්දේශය, පුරප්පාඩු පාසල් හා විෂය විස්තර හා අයදුම්පත්‍රය හා බඳවා ගැනීම පිළිබඳව වැඩිමනත් තොරතුරු www.psc.up.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

## 07. අයදුම් කළ යුතු පිළිවෙළ

01. ආදර්ශ අයදුම්පත්‍රය www.psc.up.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගත යුතුය. ඒ අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 04 දක්වා කොටස් පළමු පිටුවටද, අංක 05 සිට ඉදිරියට වන කොටස් දෙවන හා තෙවන පිටුවලටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය සැකසිය යුතුය.

02. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2015.05.05 දින හෝ ඊට පූර්ව ලැබෙන සේ "**ලේකම්, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිළිපොතගම පාර, වින්අරාව, බදුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.

03. නියමිත ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, විභාග හා පරිපාලන ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්, ප්‍රමාදවී ලැබෙන, අඩුපාඩු සහිත හා අසම්පූර්ණ සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍ර තැපෑලේදී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

04. තමන් අයදුම් කරන පුරප්පාඩු පාසල හා විෂය අයදුම්පතේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

## 08. අත්සන සහතික කිරීම :

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 230,700/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

## 09. විභාග හා පරිපාලන ගාස්තු :

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු. 400/- කි. මෙම මුදල *ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පමණක්* මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන තුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

## 10. සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**11.** මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලකා නොමැති කිසියම් කරුණක් වේනම් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කරනු ඇත.

**(අර්.එම්.ටී.බී. හාතියල්දෙණිය)**
**ලේකම්**
**ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

2015.04.17 වන දින,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බදුල්ල.